**බේස් ලයින් මාර්ග ව්‍යාපෘතිය අදියර III - 2018**

---

බේස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.මෙම ව්‍යාපෘතිය 2009 නොවැම්බර් 19 දින පවත්වන ලද කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී ගත් තීරණයක් යටතේ ක්‍රියාත්මක කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

එවකට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග ,මාර්ග සංවර්ධන සහ ඛණිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කිරුළපන සිට කොළඹ හොරණ මාර්ගය දක්වා මීටර් 860 ක් දිග නව මාර්ගයක් ඉදි කිරීම මඟින් මාර්ග තද බදය අවම කිරීමයි.ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීමේ ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 3500 ක් වන අතර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ඉදිකිරීම් පිරිවැය රුපියල් මිලියන 7041.29 විය.

## 1.3 මතය

---

මාගේ මතය,ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

## 1.4 මතය සඳහා පදනම

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධිත පාර්ශව දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

---

අසමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත

ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

(අ) වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

(ආ) අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

(ඇ) කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

(ඈ) හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කටයුතුවල භෞතික කාර්ය සාධනය

---

බේස් ලයින් මාර්ගයේ කිරුළපොන සිට දුටු ගැමුණු හංදිය දක්වා වූ කොටසේ ප්‍රතිසංස්කරණ වැඩ ව්‍යාපෘතිය විසින් 2009 වර්ෂයේ ආරම්භකර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දක්වා අඛණ්ඩව සිදුකර තිබුණි.2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ඉඩම් කැබලි 199 ක් අත්පත්කර ගැනිමට බලාපොරොත්තු විය.තවද 2018 දෙසැම්බර් 31 වන විට රුපියල් මිලියන 82.50 ක මුදලක් අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමට ප්‍රමාද වීම නිසා ඉඩම් හිමියන්ට ගෙවා තිබුණි.2018 අයවැය ඇස්තමේන්තු මඟින් රුපියල් මිලියන 100 ක් වෙන්කර තිබුණු අතර එයින් රුපියල් මිලියන 10 ක් පමණක් ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී භාවිතාකර තිබුණි.ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රධාන කොටස් පසුව අඩු කර තිබුණු අතර ඉතිරි වැඩවල භෞතික ප්‍රගතිය ඉතා මන්දගාමී මට්ටමක පැවතුණි.කෙසේවෙතත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවන ආයතනය ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාවය පිළිබඳව හා ක්‍රියාකාරකම් නවතා දැමීමට ඇති හැකියාව පිළිබඳව සලකා බැලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2 නිශ්චල ගණුදෙනු

---------------------

| විගණන ගැටළුව | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්ම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 2008 වර්ෂයේදී රුපියල් මිලියන 1.17 ක මුදලක් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසා අවතැන්වන පුද්ගලයන් සඳහා නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීම සඳහා ගෙවා තිබුණි.කෙසේවෙතත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සැලසුම් කටයුතු අවසන් කර නොතිබුණි.තවද ව්‍යාපෘතියේ විෂයපථය සීමාකර ඇති බැවින් විගණනයේදී එවැනි නිවාස යෝජනා ක්‍රමයක අවශ්‍යතාවය සාධාරණීකරණය කළ නොහැකි විය. | ව්‍යාපෘති පිරිවැය වැඩි විය. | රජයේ ප්‍රතිපත්තිවල සිදුවූ වෙනස්වීම නිසා,වැඩ විෂයපථය අඩු කර තිබුණි. . | ගෙවීම් ඇපසු අයකර ගැනීමේ හැකියාව විමර්ශනය කළ යුතුය. |